**සැ. යු.-** 2022.12.16 දින පළ වූ අංක 2311 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,312 - 2022 දෙසැම්බර් මස 23 වැනි සිකුරාදා - 2022.12.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 2336 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | — |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 2337 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 ජනවාරි මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 දෙසැම්බර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2335 - B 82412 - 5,403 (2022/12)

# රජයේ නොවන දැන්වීම්

## නාමය වෙනස් කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 ඡෙදයේ නියමයන්ට අනුකූලව ''ඇගිලිටි ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' නාමය ''ඇඩ්වාන්ටිස් ෂිප්ස් (පීවීටී) එල්ටීඩී'' වශයෙන් වෙනස් කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

සමාගම කලින් හැඳින් වූ නාමය : ඇගිලිටි ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් අංකය : පීවී 4762

ලියාපදිංචි කාර්යාලය : 400, ඩීන්ස් පාර, කොළඹ 10

සමාගමේ නව නාමය : ඇඩ්වාන්ටිස් ෂිප්ස් (පීවීටී) එල්ටීඩී

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෘෘප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

400, ඩීන්ස් පාර,
කොළඹ 10.
2022 නොවැම්බර් මස 23 වැනි දින.

12-444

---

## සී. චේන්ජ් පාට්නර්ස් ලංකා (පීවීටී) එල්ටීඩී

සමාගම් ලියාපදිංචි අංක PV 72461

**සාමාජිකයින් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දැන්වීම**

2022 දෙසැම්බර් මස 13 වැනි දින සමාගමේ පැවති විශේෂ මහා සභා රැස්වීමේ දී සම්මත වූ විශේෂ යෝජනා සම්මතය මත 2007 අංක 07 දරන සමාගම් පනතේ 319(1)(b) වගන්තිය යටතේ මෙම සමාගම 2022 දෙසැම්බර් මස 13 වැනි දින සිට සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලදී.

කේ. එම්. ෆිට්ස්ජෙරල්ඩ්,
සී. එල්. ද සිල්වා,
අධ්‍යක්ෂකවරු.

2022 දෙසැම්බර් මස 15 වැනි දින.

12-508/1

## සී. චේන්ජ් පාට්නර්ස් ලංකා (පීවීටී) එල්ටීඩී

සමාගම් ලියාපදිංචි අංකය PV 72461

**2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ සමාගමේ ඇවරකරු පත්කිරීමේ දැන්වීම**

කොළඹ 04, කාසල් පටුමගේ අංක 11 හි තුන්වන මහලෙහි පදිංචි ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් වන මා 2022 දෙසැම්බර් මස 13 වැනි දින කොළඹ 03, ගෝල්ෆේස් කෝට් 02, අංක 39 දරන ස්ථානයේ පිහිටි සී. චේන්ජ් පාට්නර්ස් ලංකා (පීවීටී) එල්ටීඩී හි පැවති විශේෂ මහා සභා රැස්වීමේ යෝජනා සම්මතයෙන් එම සමාගමේ ඇවරකරු වශයෙන් පත් කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ්,
ඇවරකරු,
සී. චේන්ජ් පාට්නර්ස් ලංකා (පීවීටී) එල්ටීඩී.

තුන්වන මහල, අංක 11,
කාසල් පටුමග,
කොළඹ 04.
2022 දෙසැම්බර් මස 15 වැනි දින.

12-508/2

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (2) වගන්තිය අනුව ලයන් බෲවරි (සිලෝන්) පීඑල්සී (PQ 57) සහ පර්ල් ස්ප්‍රින්ංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් PV 98633) ඒකාබද්ධ කිරීම

2007 අංක 07 දරන සමාගම් පනෙත් 242 (2) වගන්තිය අනුව පර්ල් ස්ප්‍රින්ංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 98633) සමග ලයන් බෲවරි (සිලෝන්) පීඑල්සී (PQ 57) ඒකාබද්ධ කිරීම සඳහා එම පනතේ 242 (3) (බී) වගන්තිය අනුව ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවන්ට සමාගම් දෙකේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වූ බවත්, ඒ අනුව එම සමාගම් දෙක ඒකාබද්ධ කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ වූ සමාගම ලයන් බෲවරි (සිලෝන්) පීඑල්සී ලෙස හඳුන්වනු ලබනු ඇති අතර, 2023 ජනවාරි මස 31 දින හෝ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් අනුමත කරනු ලබන වෙනත් දිනයක සිට අදාළ ඒකාබද්ධ කිරීම වලංගු වනු ඇත.

මෙම ඒකාබද්ධ කිරීම සඳහා අදාළ අධ්‍යක්ෂ මණ්ඩල වෙත ඉදිරිපත් කරන ලද යෝජනා, සමස්තයක් ලෙස සමාගම් දෙක

ඒකාබද්ධ කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනාවක් වශයෙන්, අදාළ පනතේ 242 (4) වගන්තියට අනුකූලව සලකනු ලබන අතර, ඒකාබද්ධ කරනු ලබන ඕනෑම සමාගමක කොටස් හිමියෙකුට හෝ ණය හිමියෙකුට හෝ ඒකාබද්ධ කරනු සමාගමක් විසින් කිසියම් වගකීමක් දරනු ලබන වෙනත් පුද්ගලයෙකුට, අංක 61 ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනය දරන ස්ථානයේ දී සාමාන්‍ය රාජකාරි වේලාවන් තුළ (පෙරවරු 8.30 සිට පස්වරු 4.30 දක්වා) එය පරීක්ෂා කර බැලිය හැක.

ඒකාබද්ධ කරන ලද සමාගමවන ලයන් බෲවරි (සිලෝන්) පීඑල්සී හි ලියාපදිංචි ලිපිනය අංක 61, ජනාධිපති මාවත, කොළඹ 01 වනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉල්ලීම පරිදි,

ලයන් බෲවරි (සිලෝන්) පීඑල්සී,
කාසන්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරුන්.

පර්ල් ස්ප්‍රින්ංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
කාසන්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරුන්.
2022 දෙසැම්බර් මස 23 වැනි දින.

12-509

**විශේෂ විදේශ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

පන්නිපිටිය, මාකුඹුර, ඩී. ඩී. කුලතුංග මාවත, අංක 425/1 දරන ස්ථානයේ පදිංචි ජයසිංහ ආරච්චිගේ නදීෂා දමයන්ති (ජා. හැ. අංක 807480251 V) යන අය විසින් හෝමාගම, පිටිපන දකුණ, අංක 470/7 දරන ස්ථානයේ පදිංචි හබරකඩ හේනාධීරගේ නිරෝෂාන් පුෂ්ප කුමාර (ජා. හැ. අංක 842501032 V) යන අය වෙත අබුඩාබි හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දී අත්සන් කර සහතික කරන ලද 2016.09.30 වැනි දිනැති විශේෂ විදේශ ඇටර්නි බලපත්‍රය ප්‍රකාර ප්‍රදානය කරන ලද විශේෂ බලය 2022.09.19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවට මහජනතාව වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

තව ද, මින් ඉදිරියට එකී ඇටර්නි බලකරු විසින් ඉහත කී විශේෂ විදේශ ඇටර්නි බලපත්‍රය යටතේ කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකීම් නොදරන බව සියලු දෙනාට ම මෙයින් දැනුම් දෙමි.

ජයසිංහ ආරච්චිගේ නදීෂා දමයන්ති.

ජා. හැ. අංක : 807480251 V

12-575

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ජාතික ඉතිරි කිරීමේ බැංකුව**

2011 අංක 11 දරන විශේෂ විධිවිධාන පනත මගින් සංශෝධිත සහ 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ වෙන්දේසි කිරීම

**නිවසක් සහිත අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ දූනගහ පත්තුවේ කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ අංක 64, කටාන බටහිර ග්‍රාමයේ පිහිටි ''කෝන්ගහවත්ත'' හෙවත් කොස්ගහවත්ත'' නමැති වරිපනම් අංක 230/27 A මඩම්පැල්ල පාර, බටහිර කටාන හි පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු යූ. එස්. කේ. එදිරිසිංහ මහතා විසින් 2018 ඔක්තෝබර් මස 25 වැනි දින මැන සාදන ලද අංක 6348 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1 දරන ඉඩම් කොටස වන උතුරට ඩී පබිලිස් ප්‍රනාන්දු සහ තව අය හිමිකම් කියන ඉඩම සහ ටී. ඩී. ප්‍රනාන්දුගේ ඉඩම ද, නැගෙනහිරට එස්. ඒ. තෙරේසා හිමිකම් කියන ඉඩම ද, දකුණට ලොට් අංක 2 දරන අඩි 10ක් පළල පාර ද, බස්නාහිරට සුසන්ත ප්‍රනාන්දු යන අයට අයත් මෙම ඉඩමේ ඉතිරි කොටස ද, යන මෙහි තුළ රූඩ් එකක් (රූඩ් 1) හෙවත් හෙක්ටයාර් 0.1012ක් විශාල ඉඩම, එහි පිහිටි නිවස සහ ඊට අයිති ගහකොළ, ගොඩනැගිලි ආදී සියලු දේ ද සමග වේ. ඉහත අංක 6348 දරන පිඹුරට අනුව මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 481/04 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

*ඉඩමට ප්‍රවේශ වන මාර්ගයේ හිමිකම සමග .-*

බලයලත් මිනින්දෝරු එන්. ඩී. ජී. සී. ගුණසේකර මහතා විසින් සකස් කරන ලද 1994 මැයි මස 15 දිනැති සහ අංක 572 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 2 (අඩි 10ක් පළල පාර) දරන බිම් තීරය මගින් පොදු මාර්ගයට ප්‍රවේශය ඇත.

*දේපළ වෙත පිවිසීම. -*

කොල්ලුපිටියේ පිහිටි ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ සිට මීගමුව පාරේ කොච්චිකඩේ නගරයට පිවිස දකුණට ඇති මඩම්පැල්ල මාර්ගයේ කි. මී. 5.5ක් පමණ ගමන් කර දකුණට ඇති අඩි 15ක් පමණ පළල කොන්ක්‍රීට් මාර්ගයේ

මීටර් 100ක් පමණ ගිය විට (දූරියන් ගස් හන්දියට මදක් කලින්) දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

මෙම දේපළ අප විසින් **2023 ජනවාරි මස 19 වැනි බ්‍රහස්පතින්දා දින පෙ. ව.11.00** ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය නිම වූ වහා ම පහත සඳහන් මුළු මුදල මුදලින් ගෙවිය යුතු ය :

1. ගැණුම් මිලෙන් 25% ක් (සියයට විසිපහක්)
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2%කි. (සියයට දෙක හමාරක ප්‍රතිශතයක්), එසේ අයකරගන්නා කොමිස් මුදලට අදාළවන රජයේ බදු මුදල් ද එකතු විය යුතු ය.
4. සම්පූර්ණ ප්‍රචාරක වියදම්,
5. ලිපිකරුගේ සහ සෝෂකකරුගේ ගාස්තුව රු. 1,500,
6. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීම සඳහා නොතාරිස් ගාස්තුව.

ගැණුම් මිලෙන් ඉතිරි වූ 75% ක මුදල සමග ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් ඕනෑම අවස්ථාවක පනවනු ලබන ව්‍යවස්ථාපිත අයබදු, තීරු බදු, හෝ මෙයට අමතරව රජයට ගෙවිය යුතු යම් ගාස්තුවක් වේ නම් එය ද සමග වෙන්දේසි දින සිට දින 30ක් තුළ බැංකුව වෙත ගෙවිය යුතු ය.

වැඩිදුර විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා අමතන්න.

ජ්‍යෙෂ්ඨ කළමණාකරු - ණය අයකර ගැනීම් 011 - 2370256 ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නැවැත්වීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ෂොක්මන් සහ සමරවික්‍රම,
පුරෝගාමී බලයලත් වෙන්දේසිකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකතන අංක 0812 - 227593
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6A ෆෙයාර් ෆිල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08,
දුරකතන අංක : 0112 - 671467
0112 671468
ඊමේල් :schokmankandy@sltnet.lk

12-497

LE/RE/208

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC බැංකුව)

(කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 303730000001.
උකස්කරුගේ සම්පූර්ණ නම : සෙත්මා ට්‍රේඩින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 4730)

(මෙහි මින් මතු ''බැංකුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධණ මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2020.11.13 වැනි දින අංක 2202 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2020.11.13 වැනි දින ''මව්බිම'' ''තිනක්කුරල්'' සහ සිලෝන් ටුඩේ'' යන පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 134, බැද්දගාන පාර, කෝට්ටේ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින් **2023.01.27 වැනි දින ප. ව. 3.00 සිට** පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සෙත්මා ට්‍රේඩින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් සමන්ත ජයවික්‍රම හා දූෂ්‍යාන්ති අර්සුන්තා ජයවික්‍රම (ණයකරුවන්) යන අය එම සමාගමේ පාලනය හා කළමණාකාරිත්වය දරන බැවින්, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් සෙත්මා ට්‍රේඩින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට ප්‍රදානය කරන ලද ණය මුදලේ නියම අර්ථලාභීන් වනුයේ, එකී සමාගම වෙනුවෙන් සමන්ත ජයවික්‍රම හා දූෂ්‍යාන්ති අර්සුන්තා ජයවික්‍රම යන අය වන හෙයින් අංක 654 දරන උකස් බැඳුම්කරයන් යටතේ රුපියල් දෙකෝටි විසිහතර ලක්ෂ හතලිස්හය දහස් දෙසිය හැත්තෑතුන (රු. 22, 446, 273.00) ක මුදලක් වර්ෂ 2020.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින් ,

ණය අංකය : 303730000001.

(01) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක් කෝටි හැත්තෑහය ලක්ෂ තිස්අට දහස් හයසිය හැටඅටයි ශත හැටදෙක (රු. 17,638,668.62) ක මුදල ද වර්ෂ 2020.09.30 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් හතලිස්අට ලක්ෂ හත් දහස් හයසිය හතරයි ශත තිස්අට (රු. 4,807,604.38) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙකෝටි විසිහතර ලක්ෂ හතලිස්හය දහස් දෙසිය හැත්තෑතුන (රු. 22,446,273.00) ක මුදල අයකරගැනීම සඳහා ද,

(02) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් එක් කෝටි හැත්තෑහය ලක්ෂ තිස්අට දහස් හයසිය හැටඅටයි ශත හැටදෙක (රු. 17,638,668.62) ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.50% ක් බැගින් වූ පොලිය 2020.10.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(03) එකී රුපියල් හතලිස්හත් ලක්ෂ අනූහත් දහස් අටසිය හතරයි ශත විසිඅට (රු. 4,797,804.28) ක මුදල මත මාසිකව 1.50% ක ප්‍රමාද පොළියක් 2020.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සිදු කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු අයකර ගැනීම සඳහා ද වේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ, මාතර මහ නගර සභා සීමාව තුළ සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 414C - ඉසදීන් නගරය ග්‍රාම නිලධාරී වසමේ හිත්තැටිය ග්‍රාමයෙහි පිහිටි මීරා පාරේ වරිපණම් අංක 83 දරන කහම්පලේ කුරුඳුවත්ත නොහොත් ඉසදීන් නමැති ඉඩමට 2018.05.11 වන දින පී.එම්. අබේගුණවර්ධන බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සම්පාදිත අංක : 1207 පිඹුර ප්‍රකාර කැබලි අංක A2 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැබලි අංක A1 හා කැබලි අංක A3 ද, නැගෙනහිරට : කැබලි අංක 18 (වරිපණම් අංක 79 දරන) ද, දකුණට : පාරකට වෙන් කළ ඉඩම් කොටස ද සහ බටහිරට: කැබලි අංක 22 (වරිපණම් අංක 87 දරන) ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිනවයයි දශම තුනක (අක්. 0-රූ. 0-පර්. 29.3) හෙවත් හෙක්ටෙයාර් බිංදුවයි දශම බිංදුවයි හතයි හතරයි එකයි බිංදුවක (හෙක්. 0.07410) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සියළු දේ ද සමග මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A861/17 හි ලියාපදිංචි කර ඇත.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්.කේ.ආර්.ටී. නානායක්කාර විසින් 2019.06.07 දින ලියා සහතික කරන ලද අංක 654 දරන උකස් බැඳුම්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

.......................,
සාමාන්‍යාධිකාරිතුමා.

2022 දෙසැම්බර් මස 16 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරී ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ - 02.

12-510/1

---

LE/RE/208.

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC බැංකුව)

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ වූ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 604725000384 සහ 604725000421.
ණයකරුවන්ගේ සම්පූර්ණ නම් : වර්ණකුලසූරිය මේරියන් මර්සි වසන්ති ප්‍රනාන්දු සහ අහංගම ලියනගේ ජයන කුමාර.

(මෙහි මින් මතු ''බැංකුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2019.09.12 වැනි දින අංක 2141 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2019.09.12 වැනි දින ''අද'', ''තිනක්කුරල්'' සහ ''සිලෝන් ටුඩේ'' යන පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 134, බැද්දගාන පාර, කෝට්ටේ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින් **2023.01.25 වැනි දින ප. ව. 3.00** සිට පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 8873 සහ 5409 දරන උකස් බැඳුම්කරයන් යටතේ රුපියල් හැත්තෑනව ලක්ෂ එක් දහස් තුන්සිය අනූපහයි ශත පහක (රු. 7,901,395.05) මුදලක් වර්ෂ 2019.07.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01) **පළමු ණය මුදල - 604725000384.**

අංක 8873 දරන උකස් බැඳුම්කරය යටතේ එකී පළමු ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හතලිස්එක් ලක්ෂ විසිතුන් දහස් පන්සිය හැටහයයි ශත හතලිස් පහක (රු. 4,123,566.45) මුදල ද වර්ෂ 2019.07.31 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් පන් ලක්ෂ හතලිස් දහස් තුනයි ශත තිස් අටක් ද (රු. 540,003.38) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හතලිස්හය ලක්ෂ හැටතුන් දහස් පන්සිය හැටනවයයි ශත අසූතුනක (රු. 4,663,569.83) මුදල අයකර ගැනීම සඳහා ද,

**දෙවන ණය මුදල - 604725000421.**

අංක 5409 දරන උකස් බැඳුම්කරය යටතේ එකී දෙවන ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් විසිඅට ලක්ෂ තිස්හත් දහස් දෙසිය තිස්අටයි ශත දහයක (රු. 2,837,238.10) මුදල ද වර්ෂ 2019.07.31 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් හාරලක්ෂ පන්සිය අසූහතයි ශත දොළහක් ද (රු. 400,587.12) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තිස්දෙලක්ෂ තිස්හත් දහස් අටසිය විසිපහයි ශත විසිදෙකක් (රු. 3,237,825.22) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැත්තෑනව ලක්ෂ එක් දහස් තුන්සිය අනූපහයි ශත පහක් (රු. 7,901,395.05) ක මුදක් අයකර ගැනීම සඳහා ද,

(02) එකී පළමු ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් හතලිස්එක් ලක්ෂ විසිතුන් දහස් පන්සිය හැටහයයි ශත හතළිස්පහක (රු. 4,123,566.45) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.50% ක් ද සහ දෙවන ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් විසිඅට ලක්ෂ තිස්හත් දහස් දෙසිය තිස්අටයි ශත දහය (රු. 2,837,238.10) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.50%ක් ද බැගින් වූ පොළිය 2019.08.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(03) එකී රුපියල් නව ලක්ෂ දහනව දහස් පන්සිය අනූවයි ශත හතලිහක (රු. 919,590.40) මුදල මත මාසිකව 2.00%ක ප්‍රමාද පොළියක් 2019.08.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සිදු කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු අයකර ගැනීම සඳහා ද වේ.

ණය අංක : 604725000384 සහ 604725000421.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කුමාර පල්ලම් පත්තුවේ, ආණමඩුව ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 612A - ආඬිගම ග්‍රාම නිලධාරී වසමේ ආඬිගම ග්‍රාමයෙහි පිහිටි රජයේ ඉඩමට 2017.09.22 වැනි දින එච්. එම්. එස්. කේ. හේරත් බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සම්පාදිත අංක 3199/2017 පිඹුර ප්‍රකාර කැබලි අංක 1 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : අ.ග.පි. 1837 හි කැබලි අංක 158 දරන පාර ද, නැගෙනහිරට : අ.ග.පි. 1837හි කැබලි අංක 159 ද, දකුණට : අ.ග.පි. 1837 හි කැබලි අංක 161 ද සහ බටහිරට : බංගදෙනියේ සිට ආණමඩුවට යන ප්‍රාදේශීය සභා පාර ද යන මායිම් තුළ පිහිටි අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් හතක (අ. 2, රූ. 1 පර් .7) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම නවයයි දෙකයි අටක (හෙක්. 0.928) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු හා එකී ඉඩම මත ඇති යන්ත්‍රෝපකරණ, හෝටල් උපකරණ, ජල සම්පාදන පද්ධති උපකරණ, විදුලි සංදේශ උපකරණ හා වායු සමන උපකරණ සමතග විදුලි සැපයුම් පද්ධති ද ඇතුළත් ඉහත මැනවින් සඳහන් කර ඇති එකී ඉඩම් කොටසට සහ පරිශ්‍රයන්ට දැන් හෝ මින් මතුවට හෝ කලින් කලට සවිකරනු ලබන හෝ ස්ථිරව යාකර සවිකරනු ලබන සියළුම සහ එක් එක් යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ, සවිකිරීම් හා වැද්දුම් ආදී සියලුදේ ද සමඟ පිඹුරු අංක 3199/2017 යටතේ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක M/Maha/15/153 හි ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම අංක 1367 (පුත්/මකු/ප්‍ර/63020) දරන ප්‍රදාන පත්‍රයේ සඳහන්, (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන අඥාපනතේ විධිවිධානවලට සහ රක්ෂිත වගන්ති හා කොන්දේසිවලට යටත්ව බැංකුවට උකස් කිරීම සඳහා, මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම්තුමාගේ පූර්ව අනුමැතිය ඔහුගේ යොමු අංක MKK/LND/2/63020/612A දරන 2018.02.21 දිනැති ලිපියෙන් ප්‍රදානය කර ඇත.

### දෙවන උපලේඛනය

**රක්ෂිත වගන්ති :**

1. ඉඩමෙහි හා එය මතුපිට ඇති සියලු ඛණිජ ද්‍රව්‍ය (මේ ප්‍රදාන පත්‍රයෙහි ඛණිජ ද්‍රව්‍ය යන යෙදුම සම්බන්ධයෙන් මැණික් ගල් ද ඇතුළත් වේ.) පිළිබඳ හිමිකම් හා එවැනි යම් ඛණිජ ද්‍රව්‍ය හෑරීමේ, සෙවීමේ, ඒ පිළිබඳව කටයුතු කිරීමේ හා බැහැර ගෙන යෑමේ අයිතිය රජය වෙත වෙන්කර තබා ගනු ලැබේ.

2. ඉඩමට ඇති අයිතිකරුගේ හිමිකම මේ ප්‍රදාන පත්‍රයේ දිනට එම ඉඩම මත ඇති මාර්ග අයිතියනට හෝ වෙනත් පරවශතාවයකට යටත් විය යුතු ය.

කොන්දේසි :

1. මෙහි සඳහන් අවම අනු බෙදුම් ඒකකය, එනම් උස්බිම් හෙක්ටයාර්/අක්කර .....ට හෝ වාරිමාර්ග පහසුකම් සහිත ඉඩම් හෙක්ටයාර්/අක්කර ..... ට වඩා ප්‍රමාණයෙන් අඩු වූ මෙම ඉඩමේ බෙදා වෙන්කළ කොටසක්/අයිතිකරු විසින් බැහැර නොකළ යුතු ය.

2. මෙහි නියමිත අවම භාගයට වඩා අඩු එනම්, ...... වඩා අඩු මෙම ඉඩමේ නොබෙදා වෙන් කළ කොටසක් අයිතිකරු විසින් බැහැර නොකළ යුතු ය.

3. කිසිම තැනැත්තකු 1 වන කොන්දේසියේ සඳහන් අවම අනු බෙදුම් ඒකකයට වඩා අඩු ප්‍රමාණයක් වූ ඉඩමේ බෙදූ කොටසක අයිතිකරු නොවිය යුතු ය.

4. 2 වන කොන්දේසියේ සඳහන් අවම භාගයට අඩු වූ ඉඩමේ නොබෙදූ කොටසකට කිසිම තැනැත්තකු අයිතිකරු නොවිය යුතු ය.

5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයීය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයීය හැකි ප්‍රදේශය සම්බන්ධයෙන් අයිතිකරු (453 වන අධිකාරය වූ) වාරිමාර්ග ආඥාපනතේ විධිවිධානවලට හා ඒ යටතේ සාදන ලද රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

6. දිසාපතිවරයාගෙන් ලිඛිත අවසරය දී උචිත බලධරයාගෙන් බලපත්‍රයක් ද ලබා ඇත්නම් මිස, අයිතිකරු විසින් ඉඩමෙහි හෝ ඒ මතුපිට කිසිම ඛණිජ ද්‍රව්‍යයක් කැණීම, සෙවීම, ලබාගැනීම තමාගේ ප්‍රයෝජනයට ගැනීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම නොකළ යුතු ය.

7. ප්‍රාදේශීය ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අවසරයක් ඇතිව මිස, ඉඩමෙහි හෝ එහි කිසිම කොටසක අයිතිය බැහැර නොකළ යුතු ය.

නිකවැරටිය ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. අයි. බණ්ඩාර විසින් 2018.04.27 වැනි දින ලියා සහතික කරන ලද අංක 8873 දරන උකස්කරය සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජී. ජී. එෆ්. ජේ. ජයවර්ධන විසින් 2018.12.26 වැනි දින ලියා සහතික කරන ලද අංක 5409 දරන උකස්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

..............................,
සාමාන්‍යාධිකාරිතුමා.

2022 දෙසැම්බර් මස 16 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ 02.

12-510/2

---

**අමානා බැන්ක් පී. එල්. සී.**

## 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරෙයිපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ප්‍රදේශයේ, අක්කරෙයිපත්තුව මහ නගර සභා සීමාව ඇතුළත අක්කරෙයිපත්තුවේ කරුන්කොඩිතිව් ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, ලොට් අංක 5, 6 සහ 10 දරන කොටස් සංයුක්ත වන ගිණිකොණදිග ඉඩම් කොටසින් ලබාගත් වයඹ කෙළවර පිහිටි ඉඩම් කොටස ප්‍රමාණයෙන් උතුරේ සිට දකුණට : නැගෙනහිර දෙසට අඩි 36 අඟල් 08, පළල අතට අඩි 27 1/2, නැගෙනහිර සිට බටහිරට : උතුරු දෙසන් අඩි 43, දකුණු දෙසින් අඩි 40ක් වූ ද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ.

බලයලත් මිනින්දෝරු ඒ. ජී. මොහොමඩ් තයියුබ් විසින් සකස් කරන ලද 2014.08.25 දින අංක MT/174/14 දරන පිඹුර ප්‍රකාරව මෑතකාලීන මැනීමකට සහ විස්තරයකට අනුව, එකී ඉඩම පහත පරිදි විස්තර කර ඇත.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරෙයිපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අක්කරෙයිපත්තුව මහ නගර සභා සීමාව ඇතුළත කරුන්කොඩිතිව් ග්‍රාමයේ පිහිටා ඇති, ඉඩම සඳහා වූ 2014.08.25 දින අංක MT/174/14 දරන පිඹුරේ සඳහන් මැවත මනින ලද ලොට් A හි කොටසක් වන ලොට් අංක 01

ප්‍රමාණය පර්චස් 4.82ක් හෙවත් හෙක්ටයාර් 0.0122ක් වූ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ එහි අන්ර්ගත වෙනත් සියලු දේ ද වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 486, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තාවූ ද 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වූ ද, ලියාපදිංචි අංක PB 3618 PQ දරන අමානා බැන්ක් පී. එල්. සී. ආයතනය වෙනුවෙන් අම්පාර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. රෝසන් අක්කාර් විසින් සහතික කරන ලද 2015 අප්‍රේල් මස 06 වැනි දින අංක 268 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත සහ 2016 සැප්තැම්බර් මස 22 වැනි දින අංක 546 දරන ද්විතියික උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ''බන්ධනදායින්'' යනුවෙන් හඳුන්වනු ලබන බෂීර් නිසාම්, මොහොමඩ් ඉස්මායිල් නිස්රිනා සහ මොහොමඩ් බෂීර් අහමඩ් ෂාබ්‍රි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද, අමානා බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව,

ඉහත සඳහන් දේපළ වර්ෂ **2023 ක්වූ ජනවාරි මස 19 වැනි දින පෙ. ව. 1.00** ට ද දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - අක්කරෙයිපත්තු නගරයේ ඔරලෝසු කණුවේ සිට පොතුවිල් පාර ඔස්සේ මීටර් 400 ක් පමණ ගමන් කර වමට හැරී නැගෙනහිර පාර ඔස්සේ මීටර් 200 ක් පමණ ගමන් කර වමට හැරී අයිස් මිල් පාර ඔස්සේ මීටර් 100ක් පමණ ගමන් කර වමට හැරී මීටර් 50ක් ගමන් කර අනතුරුව දකුණට හැරී මීටර් 30ක් ගමන් කළ විට මෝටර් රථ ප්‍රවේශ වියහැකි පටුමගට මුහුණ ලා වම් අත පැත්තේ පිහිටි විෂයගත දේපළ වෙත ළඟා විය හැක.

*ගෙවීමේ කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය :

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනුව 90% ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුලත අමානා බැන්ක් ඔෆ් පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය .
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකකරු හා සෝෂක වේතනය රු. 2,000,
(07) නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 4,000.

* මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID - 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

අනෙක් තොරතුරු සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න:

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කෙමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, 2 වන මහල, හල්ස්ඩ්‍රෝෆ් විදිය, කොළඹ 12 ,
දුරකතන අංක : 077 3242954 - 0112 - 396520.

අයකිරීම් අංශය,
අමානා බැන්ක් පී. එල්. සී.,
අංක 486, ගාළු පාර,
කොළඹ 03.
දුරකථන අංක : 011 - 5238370
යොමුව : 2112

12-511

**අමානා බැන්ක් පී. එල්. සී.**

## 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අඩ්ඩලචෙනායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ප්‍රදේශය යටතේ වූ අඩ්ඩලචෙනායි ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත අක්කරෙයිපත්තුවේ තායිකනගර අඩ්ඩලචෙනායි - 16 ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත අඩ්ඩලචෙනායි ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, ''කෝනවත්තෙයි තොට්ටම්'' යනුවෙන් හඳුන්වනු ලබන ලොට් අංක 67, 68, 69 සහ 70 දරන කොටස් සංයුක්ත වන ලොට් අංක 03 දරන කොටසේ පිහිටි ඉඩම් කොටසක නිරිතදිග කොටසින් ලබාගත් ඉඩමේ වයඹදිග කෙළවර පිහිටි ඉඩම් කොටස.

ප්‍රමාණයෙන් උතුරේ සිට දකුණට අඩි විසිඅටක් ද (28) නැගෙනහිර සිට බටහිරට අඩි හතලිස් අටක් ද, (48) වන කල්මුනේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එච් 23/117 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ එහි අන්තර්ගත වෙනත් සියලු දේ ද වේ.

බලයලත් මිනින්දෝරු ඒ. ඒ. මොහොමඩ් තස්ලිම් විසින් සාදන ලද 2015.01.28 දින අංක T/2062 දරන මෑතකාලීන මැනීමකට සහ විස්තරයකට අනුව ඉහත කී ඉඩම් කොටස පහත දැක්වෙන පරිදි විස්තර වේ. එනම්,

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අඩ්ඩලාචෙනායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ප්‍රදේශය යටතේ වූ අඩ්ඩලචෙනයි ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත අක්කරෙයිපත්තුවේ තායිකනගාර් අඩ්ඩලචෙනායි 16, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අඩ්ඩලාචෙනායි ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, ලොට් A ලෙස ලකුණු කර ඇති (අංක T/1471 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 1 දරන කොටස නැවත මැනීමක් වන)

ප්‍රමාණය පර්චස් පහයි දශම එකක් (පර්. 5.1) හෙවත් හෙක්ටයාර් 0.0130ක් ඉහත කී ලොට් A දරන බෙදා වෙන් කරන ඉඩම් කොටස සහ එහි අන්තර්ගත වෙනත් සියලු දේ ද වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 486, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තාවූ ද 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වූ ද, ලියාපදිංචි අංක PB 3618 PQ දරන අමානා බැන්ක් පී. එල්. සී. ආයතනය වෙනුවෙන් අම්පාර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. රෝසන් අක්තාර් විසින් සහතික කරන ලද 2015 අප්‍රේල් මස 06 වැනි දින අංක 270 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත සහ කල්මුනේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. බදුර්දීන් විසින් සහතික කරන ලද 2018 දෙසැම්බර් මස 24 වැනි දින අංක 7776 දරන ද්විතියික උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ''බන්ධනදායින්'' යනුවෙන් හඳුන්වනු ලබන බෂීර් නිසාම්, මොහොමඩ් ඉස්මායිල් නිස්රිනා සහ මොහොමඩ් බෂීර් අහමඩ් ෂාබි යන අය විසින් පැහැර හැර ඇති

හෙයින් ද, ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද, අමානා බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව,

ඉහත සඳහන් දේපළ වර්ෂ **2023 ක්වූ ජනවාරි මස 19 වැනි දින ප. ව. 2.00 ට** දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - අක්කරෙයිපත්තු නගරයේ ඔරලෝසු කණුවේ සිට කල්මුණේ පාර ඔස්සේ අඩ්ඩලයිචෙනයි - අක්කරෙයිපත්තු සීමා පාර දක්වා කිලෝමීටර් 2.5ක් පමණ ගමන් කර අනතුරුව දකුණට හැරී සීමා පාර ඔස්සේ තයික නගර් ජලාපවහන පාර දක්වා වංගුව පසුකර මීටර් 500ක් පමණ ගමන් කර අනතුරුව වමට හැරී ජලාපවහන පාර ඔස්සේ පාරට මුහුණ ලා දකුණු අත පැත්තේ පිහිටි විෂයගත දේපල දක්වා මීටර් 50ක් පමණ වේ.

*ගෙවීමේ කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුලත අමානා බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකකරු හා සෝෂක වේතනය රු. 2,000,
(07) නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 4,000.

* මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID - 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

අනෙකුත් තොරතුරු සඳහා පහත සඳහන් නිළධාරින්ගෙන් විමසන්න.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, 2 වන මහළ, හල්ස්ඩ්‍රෝෆ් වීදිය, කොළඹ 12.
දුරකතන අංක : 077 3242954 - 0112 - 396520.

අයකිරීම් අංශය,
අමානා බැන්ක් පී. එල්. සී.,
අංක 486, ගාළු පාර,
කොළඹ 03.
දුරකථන අංක : 011 - 5238370,
යොමුව : 2112.

12-512

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ වර්ෂ 2023ක් වූ ජනවාරි මස 23 වැනි දින පෙ. ව. 10.00 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

